# අදිසි 4

ජගත් ජේ එදිරිසිංහ ලියයි

අවසාන පර මල් කූඩය කුණු ගොඩට හැලූ සෙදෝරිස් නැවතී හති දමයි. ඊයේ පෝය බැවින් පන්සල යකා නැටූ පිටියක් බවට පත්ව ඇත. ඒ සියල්ල යථා තත්ත්වයට පත් කරන තුරු ඔහුගේ සිතට නිවනක් නැත.

"හෙමින් වැඩ කරන්න සෙදෝරිස් උන්නැහේ... කලබලයක් නැහැ නෙව.." ලොකු හාමුදුරුවන් කීප වතාවක් කීව ද ඔහුට වගේ වගක් නැත.

"කවදා කළත් ඉතින් මංමනෙ මේක කරන්න ඕනෙ.." සෙදෝරිස් තමාටම මුමුණා ගනියි. හිත තිබුණද ගතට සවියක් නැති බවක් ඔහුට දැනෙයි. පෝය හේතුවෙන් පෙරදා රැයේ හරියාකාර නින්දක් නොලැබීමේ අපහසුව තවමත් දැනෙයි. සෙම අමාරුවද නැවත වැඩි වී ඇත. කලින් වතාවේ කාසිම් දොස්තර දුන් බෙහෙත් පෙති අවසන් වූයේ සතියකට පෙර ය. සවසට කෙසේ හෝ ඩිස්පෙන්සරියට යා යුතු ය.

බණ මඩුවේ කෙළවරක අයෝමා සමඟ කතාවට වැටී සිටින පොඩි හාමුදුරුවන් දෙස ඔහු හෙළන්නේ නොපහන් බැල්මකි.

"දානෙ ගෙනාවානං ඒක පූජා කරලා ආපහු යන්නෙ නැතිව මෙතන කොමලෙ පටන් ගත්තා.." සෙදෝරිස් හිත යටින් ආයෝමාට බැණ වදියි. "...පොඩි උන්නාන්සෙත් සිල් බිඳ ගත්තෙ නැත්නං පුදුමයි.."

සොදෝරිස් ඉදලත් ඇදගෙන ඒ දෙසට යන්නේ අතුගාන මුවාවෙන් කතාවට කන් දෙන්නට ය.

"බණ මඩුවෙ පන්තියක් දාන්ඩ ජයන්ත මහත්තයත් කලින් වතාවක් ඇහුවා.. ලොකු හාමුදුරුවො කැමති වුණේ නැහැ.. " පොඩි හාමුදුරුවන්ගේ කියනු සෙදෝරිස්ට ඇසෙයි.

"පුදුමයි.." අයෝමාගේ සිනාව සෙදෝරිස්ගේ සිතේ ඇති කරන්නේ කෝපයකි. පොඩි හාමුදුරුවෝ අයෝමාගේ කතාවට ප්‍රති උත්තර දෙන්නට නොයති. ලොකු හාමුදුරුවන් ගැන අයහපත් දෙයක් ඇය සමග කතා කරන්නට අකැමැති සේ ය.

"උපාධිය ඉවර කරන හුඟක් අය ලේසියට කරන වැඩක්නෙ ටියුෂන් පන්ති දාන එක.. ටියුෂන් පන්තියක් දානවට වඩා වැඩි දෙයක් අයෝමට කරන්න පුලුවන්.. ලේසි පාර ම හොයන්න එපා.." පොඩි හුමුදුරුවන්ගේ අවවාදය අයෝමාගේ සිතේ ඇති කරන්නේ ලැජ්ජාවකි.

"මං එහෙම හිතුවෙ නැහැ හාමුදුරුවනේ.. රස්සාවක් හොයාගන්නකල් මොකක් හරි කරන්නයි මට ඕනෙ වුණේ.."

"එහෙම නං ටියුෂන් පන්ති දාන්නම එපා.. අන්තිමේ පන්ති වල ඉගෙන ගන්න එන ළමයි අමාරුවේ වැටෙනවා අයෝමා රස්සාවකට ගියාම.."

අයෝමා කිසිවක් නොකියා පන්සලේ මහ ගේට්ටුව දෙස බලා සිටියි. මහ ගේට්ටුව ඉහළින් ඇති මකර තොරණේ බදාම ගැළවෙමින් ඇත. කීප වතාවක් අලුත්වැඩියා කළ බවට ලකුණු ඇති නමුදු අලුත් බදාම පරණ සැකිල්ල විසින් ප්‍රතික්ෂෙප කරමින් ඇති බවක් අයෝමාට පෙනෙයි. මේ තොරණ අලුතින්ම තැනිය යුතුය.

"ලොකු හාමුදුරුවො ඡන්දෙන් දින්නම තොරණ අලුතින් හදන්න පුලුවන් වෙයි.." අයෝමා සිනාසෙයි.

"මොන තොරණ ද..?"

"පන්සලේ මහ තොරණ... හැදුවෙ නැත්නම් ඒක ළඟදිම කඩන් වැටෙයි"

පොඩි හාමුදුරුවෝ ඇගේ අදහසට පොහොර දමන්නට නොසිතති. ඈ කතා කළේ උපහාසයෙන් යයි උන් වහන්සේට සිතෙයි. පන්සල හෝ ලොකු හාමුදුරුවන් හෝ උපහාසයට ලක්වණු දැකීම සිත නොසන්සුන් කරයි. සියල්ල දෙස කොයි තරම් කාලයක් උපේක්ෂාවෙන් බලා සිටින්නට හැකිවේදැයි උන්වහන්සේට නොදැනෙයි.

පන්සලේ මහ ගේට්ටුවෙන් පන්සල් බිමට වාහනයක් හැරවෙයි.

"රණසිංහ මහත්තයා.." පොඩි හාමුදුරුවෝ මුමුණති. වාහනය කෙළින්ම යන්නේ ආවාසය පැත්තට ය. "ලොකු හාමුදුරුවො හම්බවෙන්ඩ වෙන්ඩැති.."

"මං යන්නං හාමුදුරුවනේ.." අයෝමා කොට බිත්තිය මත තබා තිබූ පොත් කීපය අතට ගනියි. පොඩි හාමුදුරුවන් යමක් කියන්නට පෙර ම ඕ ඉක්මන් ගමණින් වැලි මිදුල මැදින් ගොස් පාරට බසියි. වාහන මගහැර පාර පනින අයෝමා දෙස බලා සිටි පොඩි

**"දානෙ ගෙනාවානං ඒක පූජා කරලා ආපහු යන්නෙ නැතිව මෙතන කොමලෙ පටන් ගත්තා.." සෙදෝරිස් හිත යටින් ආයෝමාට බැණ වදියි. "...පොඩි උන්නාන්සෙත් සිල් බිඳ ගත්තෙ නැත්නං පුදුමයි.." සොදෝරිස් ඉදලත් ඇදගෙන ඒ දෙසට යන්නේ අතුගාන මුවාවෙන් කතාවට කන් දෙන්නටය.**

---

හාමුදුරුවෝ සෙදෝරිස් දෙසට හැරෙති.

"දැං ඔතැන හොර ගල් ඇහිලුවා ඇති සෙදෝරිස් උන්නැහේ.. ඒ ළමයා ගියානේ.. ආවාස ගේ පැත්තට ගියා නං හොඳයි නේද..? රණසිංහ මහත්තයට තේ කෝප්පයක් හදන්ඩත් වෙයි නෙ.."

00000000

"මල්ලි ඔහොම කිව්වට අයියට කරන්න පුලුවන් දේවලත් සීමාවක් තියෙනවා.. තේරුම් ගන්න.. මන්ත්‍රී කෙනෙක් වුණ පළියට හැම දේම කරන්න පුලුවන් කියලා හිතන්න එපා.. ඒක වැරදියි" වින්ධ්‍යා කියන්නේ සිය සොහොයුරා ගේ පිඟානට බත් හැන්දක් දමන අතර ය.

කුසල් සිය සොහොයුරියගේ මුහුණ දෙස නොබලා ජනේලය තුළින් මිදුල දෙස බලා සිටියි. නිවසත් එය වටා පැතිරගත් අවකාශයත් සුන්දර නිස්කලංක බවක වෙලී ඇති සැටියක් වින්ධ්‍යාට දැනෙයි. රණසිංහ නිවසේ සිටින විට මේ පරිසරය යුද පිටියක් සේ ය. ඔහු සිටිනා විට නිදහසට හෝ පුද්ගලිකත්වයට හෝ ඉඩක් නැත. බලන බලන තැන මිනිසුන් ය. ආරක්ෂකයන් ය. වාහන ය. ඇස සනසන එක දසුනකට හෝ ඉඩක් නැති තැන වින්ධ්‍යා කරන්නේ ඇතුල් කාමරයකට වැදී පොතක් කියවන එක ය. පිටතින් ඇසෙන ඝෝෂාව එයට ද බාධාවකි.



"ඉඩම මගේ.. බිල්ඩිම හදන සල්ලි මගේ.. මං මහ ලොකු දෙයක් ඉල්ලන්නෑනෙ... මං කියන්නෙ මේ ප්ලෑන් එක ඇප්රෑව් කරගන්න පොඩි සපෝට් එකක් දෙන්න කියලා විතරයි.." සිය සොහොයුරා සිටින්නේ නොපහන් සිතින් බව වින්ධ්‍යාට වැටහෙයි. ".. නොවටිනා ගාණක් දීලා වැවට මායිම කරලා මේ ඉඩම අරගත්තෙම හෝටලයක් දාන්නමයි.. අක්කත් ඒක දන්නවනේ.."

"ඒක නීතියට එකඟ නැති වැඩක් නම් අයිය අත දායි කියලා මං හිතන්නෙ නෑ.."

"නීතියට එකඟව හරි පාරෙන් ගිහින් කරන්න පුලුවන් දෙයක් නං මං අයියගේ උදව් ඉල්ලන්න එන්නෙ නෑනෙ.. අයියගෙ එක ටෙලිෆෝන් කෝල් එකකින් මේ වැඩේ කරන්න පුලුවන්.. එහෙමත් බැරිනං ඇමති තුමාගෙ න් හරි උදව්වක් ඉල්ලන්න අයියට බැරි කමක් නෑනෙ.."

"අප්පච්චි දන්නවද මල්ලි අයියගෙන් මෙහෙම දෙයක් ඉල්ලන්න ආවයි කියල..?"

"දන්නව.. "

"දන්නවා..? අප්පච්චි දන්නවා..? මං හිතන්නෙ නෑ අප්පච්චි දැනුවත්ව ඔහොම වැඩකට ඔයාට එන්න දෙයි කියලා.."

කුසල් සොහොයුරියගේ මුහුණ බලන්නේ අමනාපයෙනි. ඒ නොපහන් බව ඔහුගේ ඇස් වලින් වින්ධ්‍යාට පෙනෙයි. සිය සොහොයුරා ගේ නොපැසුණ බව ඇගේ සිතට බරකි. නීති විරෝධී ඉදිකිරීමක් සඳහා සහය පතා සිය සැමියා ඉදිරියේ වුව දෙවැනි වන්නට වින්ධ්‍යාට නොසිතෙයි.

"මේ අහන්න.. මගේ මිනිහ ඉස්සරහ වුණාත් මගේ කෙනෙක් පාච්චල් වෙනවා දකින්න මං කැමති නැහැ.."

"මිනිහෙක් පවුලකට බැඳුණාට පස්සෙ ඒ මිනිහ පිට මිනිහෙක් වෙන්නෙ නෑනෙ.. එයත් පවුලෙ කෙනෙක්... එයාටත් යුතුකමක් තියෙනවනෙ අපේ පවුලෙ දියුණුවට අත දෙන්න.."

තව තවත් මේ ගැන කුසල් හා කතා කිරීමෙන් පලක් නැති බව වින්ධ්‍යාට වැටහෙයි.

"ඔයා ලෝකෙ ගැන දන්නෙ බොහොම ටිකයි මගෙ මල්ලියෙ.. ඔයත් කසාදයක් බැන්ද දාට මේ හුඟක් දේ තේරුම් යයි.." ඈ කියන්නේ කෑම මේසයෙන් නැගිටින අතර ය. ".. අයිය ආවම ඔයාම අහන්න.. මට නං බෑ ඕවට මැදිහත් වෙන්න.."

"දැන් එයි ද..?"

"එන වෙලාව... යන වෙලාව.. දෙයියෝ තමයි දන්නෙ.. එයි ද නේයි ද කියලවත් මං නං දන්නෙ නෑ.."

"ඔයා අහන්නෙ නැද්ද...?"

"මන්ත්‍රී කෙනෙක් කියන්නෙ ගෙදර ගෑණිට අයිති සත්වයෙක් නෙවෙයි.. කොටින්ම එයා එයාටවත් අයිති නෑ වගේ.."

**කුසල් සොහොයුරියගේ මුහුණ බලන්නේ අමනාපයෙනි. ඒ නොපහන් බව ඔහුගේ ඇස් වලින් වින්ධ්‍යාට පෙනෙයි. සිය සොහොයුරා ගේ නොපැසුණ බව ඇගේ සිතට බරකි. නීති විරෝධී ඉදිකිරීමක් සඳහා සහය පතා සිය සැමියා ඉදිරියේ වුව දෙවැනි වන්නට වින්ධ්‍යාට නොසිතෙයි.**

---

කුසල් හිස් පිඟාන මත ඇඟිල්ලෙන් ඉරි අඳිමින් කල්පනා කරමින් සිටිනු වින්ධ්‍යා දකියි.

"අපි හිතා ඉන්නෙ අක්ක මෙහේ සතුටෙන් ඉන්නවා කියලයි.." ඔහු බොහෝ වේලාවකට පසුව කියයි.

"ඇයි මං අසතුටෙන් ඉන්නවා වගේ ද පේන්නෙ..?" වින්ධ්‍යා සිනාසෙන්නට වෑයම් කරයි. ඇගේ ඒ අසාර්ථක උත්සාහය කුසල් ගේ සිතේ ඇති කරන්නේ කණගාටුවකි. "අක්කා අපට නොකියා දුක් විඳිනවා.." සිතුවිල්ල විදුලියක් සේ ඔහුගේ සිත හරහා දුවයි.

"මං ආව වෙලාවෙ ඉඳන් ඔයා කතා කළ හැම වචනයකම මං දැක්කෙ කළකිරීම.. ඒක හංගන්න ඔයාට බැහැ.." ඔහු කියන්නේ සොහොයුරිය ගේ මුහුණ දෙස බලාගත්වන ම ය.

"කෑම කාල ඉවර නං අත සෝදා ගන්න.." වින්ධ්‍යා මේසය මත වූ බඳුන් දෙකක් දෑතට ගනිමින් මුළුතැන් ගෙය දෙසට යයි. ඒ මේ කතාවෙන් මග හැර යන්නට බව කුසල් දනියි. සිය සොයුරිය පිලිබඳ කණගාටුවකින් ඔහුගේ සිත පිරී යයි. නුවර ගිය පසුව මේ ගැන පියා හා කතා කළ යුතු යයි ඔහු සිතයි.

36 වන පිටුවට